| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.16 පැය 0910 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 71 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

## 01. මනුෂ්‍ය ඝාතනයක් - හම්බේගමුව පොලිස් වසම.

2025.01.15 වන දින සවස් කාලයේ හම්බේගමුව පොලිස් වසමේ කරමැටිය ප්‍රදේශයේ වාඩියක පුද්ගලයින් පිරිසක් අතර ඇති වූ ආරවුලක් හේතුවෙන් සිදුකළ පහරදීමකින් එක් පුද්ගලයෙකු තුවාල ලබා ප්‍රතිකාර සඳහා හම්බේගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට හම්බේගමුව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 63 ක් වූ කල්තොට, බලංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරණකරු පුද්ගලයින් පිරිසක් සමඟ වාඩියෙහි මත්පැන් පානය කර ඇති බවත්, එහිදී ඇතිවූ බහින්බස්වීමක් දුරදිග යාමෙන් පුද්ගලයෙක් විසින් පහරදීමෙන් මෙම ඝාතනය සිදුව ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නය අනුව අනාවරණය වී ඇත.

මෘත ශරීරය හම්බේගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරු ප්‍රදේශයෙන් පලා ගොස් ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා හම්බේගමුව පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 02. අපරාධයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.

2024.12.23 වන දින නාරාහේන්පිට පොලිස් වසමේ තිඹිරිගස්යාය ප්‍රදේශයේ නිවසක සිටි පුද්ගලයෙකුට තෙරපි කිරීමේ අදහසින් පැමිණි **පුද්ගලයෙකු මාංශපේෂි ලිහිල් කිරීමට බව පවසා බෙහෙත් කරලක් ලබාදී සිහිමුජර්ා වීමෙන් පසු රුපියල් කෝටි 02 ට අධික වටිනාකමින් යුත් දියමන්ති මාලයක් හා විදේශ මත්පැන් බෝතල් සොරකම් කිරීම** සම්බන්ධයෙන් බස්නාහිර පළාත දකුණ දිසාව අපරාධ කොට්ඨාසය මගින් විමශර්න ආරම්භ කර තිබුණි.

ඒ අනුව, සිද්ධියට සම්බන්ධ සැකකරු 2025.01.15 වන දින දහවල් කාලයේ බොරැල්ල පොලිස් වසමේ කාසල්වීදිය ප්‍රදේශයේදී බස්නාහිර පළාත දකුණ දිසාව අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන ගල්වලයාය, තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩිදුර විමශර්නයේදී, මහනුවර ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් සහ දඹුල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් වරෙන්තු

නිකුත් කරන ලද සැකකරුවෙකු බවට අනාවරණය වී ඇත. බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. වෙඩි තබා පුද්ගලයෙකුට තුවාල සිදු කිරීමක් - ඇලපාත පොලිස් වසම.

2025.01.15 වන දින අළුයම් කාලයේ ඇලපාත පොලිස් වසමේ උඩනිරිඇල්ල ප්‍රදේශයේදී පදිංචි පුද්ගලයෙකුට සිදු කළ වෙඩි තැබීමකින් තුවාල ලබා ප්‍රතිකාර සඳහා රත්නපුර රෝහලට ඇතුලත් කර ඇති බවට ඇලපාත පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 36 ක් වන උඩනිරිඇල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

තුවාලකරුගේ වැඩිමහල් සහෝදරයා විසින් පුද්ගලික ආරවුලක් හේතුවෙන් බෝර 12 වගර්යේ ගිනි අවියකින් මෙම වෙඩි තැබීම සිදු කර ඇති සැකකරු ප්‍රදේශයෙන් පලාගොස් ඇත. ගිනි අවියේ හිමිකරු ගිනි අවියද සමඟ අත්අඩංගුවට ගෙන ඇති අතර පලා ගිය සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ඇලපාත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**